කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය-භූගෝල විද්‍යාව

ශ්‍රේණිය -12

සකස් කළ ගුරුභවතාගේ නම - ජී.එල්.තිළිනිකා මධූෂානි

පාසල - ර/බඹරබොටුව විජයබා ම.වි.

පාඩම - 1

නිපුණතා මට්ටම 1.1 - භූගෝල විද්‍යාව හඳුන්වයි.

1.) භූගෝල විද්‍යාව සම්බන්ධ නිර්වචන අතර "මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනය භූගෝල විද්‍යාවයි. " යනුවෙන් ඉදිරිපත් කළේ,

1. රිචඩ් හාඩ්ෂෝන්
2. කාල් රිටර් හා වොන් හම්බෝල්ට්
3. රැට්සල් හා සෙම්පල්
4. විඩාල් ඕ ලා බ්ලාෂ්

2.) භූගෝල විද්‍යා විෂය සම්බන්ධ වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

1. මිනිසා පරිසරය වෙනස් කරන්නේ කෙසේද යන්න අධ්‍යයනය කිරීමයි.
2. මිනිස් පරිසර අන්තර් ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵල මොනවාද යන්න අධ්‍යයනය කිරීමයි.
3. භූ දර්ශනයෙහි අන්තර්ගත සංරචක ඒවා අතර ඇති සම්බන්ධතා කාලීන හා අවකාශීය වශයෙන් වෙනස් වන ආකාරය අධ්‍යයනයයි.
4. අවකාශීය විවිධත්වය ඔස්සේ මතුවන භූගෝලීය රටා මොනවාද යන්න අධ්‍යයනය කරයි.

3.) කාල් රිටර් හා වොන් හම්බෝල්ට්ගේ නිර්වචනයට අනුව එහි අන්තර්ගත වන්නේ,

1. පරිසරය මිනිසාට බලපාන්නේ කෙසේද?
2. මිනිසා පරිසරය වෙනස් කරන්නේ කෙසේද?
3. මිනිස් පරිසර අන්තර් ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵල මොනවාද?
4. ඉහත සියල්ලම

4.) භෞතික හා මානුෂ ප්‍රපංචවල ගතිකත්වය අධ්‍යයනය කරන්නේ කුමක් පදනම් කරගෙනද?

1. භෞතික භූ දර්ශනයේ විවිධත්වය පදනම් කරගෙනය.
2. භූගෝලීය රටා පදනම් කරගෙනය.
3. රටා ඇතිවීමට බලපාන හේතු පදනම් කරගෙනය.
4. ස්ථානීය පිහිටීම පදනම් කරගෙනය.

5.) භෞතික භූ දර්ශනය අවකාශීය හා කාලීන වශයෙන් වෙනස් වීමට බලපාන හේතු අතර වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

1. අන්තර්ජනා‍ය හා බහිර්ජනා‍ය ක්‍රියාවලි
2. ගංවතුර ඇති වීම.
3. නායයෑම් ඇති වීම.
4. ගිනිකඳු පිපිරීම්

6.) භූ රූප නිර්මාණය සම්බන්ධ ක්‍රියාවලිය තුළ පරිසරය ක්ෂණිකව වෙනස්වීමට බලපාන්නේ,

1. නැමිකඳු නිර්මාණය
2. භූමිකම්පා හා ගිනිකඳු පිපිරීම්
3. ග්ලැසියර් දියවීම
4. නව සාගරික පතුල් නිර්මාණය

7.) මිනිසාගේ මැදිහත්වීම නිසා භෞතික භූ දර්ශනය වෙනස් වී ඇති බවට නිදසුනක් නොවන්නේ,

1. කඳු එළි කිරීම නිසා නායයෑම.
2. සංවර්ධන කටයුතු නිසා ජල මාර්ග අවහිර වීම.
3. අධික වර්ෂාව නිසා නායයෑම.
4. කෘෂි කාර්මික කටයුතු සඳහා වනාන්තර විනාශ කිරීම.

8.) භූගෝල විද්‍යා විෂය සාකල්‍ය ප්‍රවේශයකින් අධ්‍යයනය යටතට ගැනෙන්නේ,

1. ගෝලීය පරිමාණයෙන්
2. ප්‍රාදේශීය පරිමාණයෙන්
3. ස්ථානීය පරිමාණයෙන්
4. ඉහත සියල්ලම

**<u>පිළිතුරු පත්‍රිකාව</u>**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 2 | 6 | 2 |
| 2 | 3 | 7 | 3 |
| 3 | 4 | 8 | 4 |
| 4 | 4 | | |
| 5 | 1 | | |